# STREAM

ප්‍රතිපත්ති
සාරාංශය

පෙබරවාරි -- 2005

www.streaminitiative.org

අංක 1


සාරාංශගතය

ඒකමතිකතාවය ගොඩනැගීම

... පිටු 02 ක් ඇතුළත

සාරාංශය

**මෙය කුමක් ගැන ද?**

**ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා මිනිසුන් ඒකමතිකතාවයකට එළඹීම**

**මෙය කියවිය යුත්තෙ...**

... ප්‍රතිපත්ති වෙනසක් ඇති කිරීම සඳහා ඔබ උනන්දු නම්ය.

මෙහි අඩංගු වනුයේ:

- ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය යුතු ජීවන තත්ත්ව පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටය.
- ප්‍රතිපත්ති සහ සේවා දරන්නන් වෙතින් පවතින ප්‍රතිපත්ති සහ ඒවායේ විය යුතු වෙනස්කම් පිළිබඳ අදහස් ලබා ගැනීම.
- වැඩමුළු, තත්ත්ව අධ්‍යයන, නාට්‍ය, සහ වෙනත් ස්ථාන වලින් ලද අත්දැකීම් ය.

ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා ඒකමතිකතාවය ගොඩනැගීම

"තිරණ ගැනීමේදි සම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර වීම

"මිනිසුන් නියම ආකාරයෙන් සාකච්ජා සඳහා සහභාගි වන බවට තහවුරු වීම

"කණ්ඩායම් සහභාගිත්වය තහවුරු කිරීම සහ එක් තිරණයක් සඳහා ඒකමතිකව එකඟවීම.

මෙය රාජකාරි හෝ රාජකාරි නොවන මට්ටමින් කුඩා සහ විශාල කණ්ඩායම් සඳහා භාවිතා කරයි

මෙමගින් මිනිසුන් ට ප්‍රතිපත්ති සාදන්නන් සහ ක්‍රියාත්මක කරන්නන් වෙත නිදහසේ ලඟා වීමට අවකාශ ලබා දේ.

මෙමගින් විධිමත් වූ ප්‍රතිපත්ති වෙනසකට යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සාදා දෙයි.

මෙම සාරාංශගතය සමග ඔබට හැකිනම් පහත සඳහන් දේ කථා කරන්න.

ප්‍රතිපත්ති සාදන්නන් සහ ක්‍රියාත්මක කරන්නන් සමග සාකච්ජා කර ඒකමතිකතාවයක ට එළඹීමට ප්‍රතිපත්ති දරන්නන් හට අවස්ථාව ලබා දිම.

සාරාංශගතය **...**

ප්‍රතිපත්ති නියම ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා මිනිසුන් ගේ ජීවනෝපායට අදාල වන සේ ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය. මිනිසුන්ගේ විවිධ වූ ජීවන අභිමතාර්ථ, අවධානම් තත්ත්ව, සාමුහික ක්‍රියාකාරකම් සහ ජීවනෝපාය මාර්ග අවබෝධ කර ගැනීම පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා ප්‍රතිපත්ති දරන්නන් වෙත ලඟා විය යුතුයි. ඔවුන් සමග විශ්වසනියත්වය ගොඩනැගීම සඳහා භාවිතා කළ හැකි විවිධ ක්‍රම උපායන් ඇත.

මේ සමගම මිනිසුන්ගේ ජිවන තත්ත්ව අවබෝධ කර ගනිමින් පවතින ප්‍රතිපත්ති පිළිබඳ ඔවුන්ගේ හැඟිම් සහ වෙනස් විය යුතු සහ අළුතෙන් සකස් කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව ද අවබෝධයක් ලැබිය යුතුය.

පවතින සංස්කෘතික, සමාජ ආර්ථික බාධක නිසා ප්‍රතිපත්ති සාදන්නන් සහ දරන්නන් අතර සන්නිවේදනය බොහෝ විට නිසියාකාරව සිදු නොවේ. මෙය මග හරවා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපක්‍රම රාශියකි. උදාහරණයක් ලෙස, මිනිසුන්ගේ ජිවන තත්ත්ව ආශ්‍රයෙන් චිත්‍රපට නිපදවීම, නාට්‍ය සංදර්ශන පැවැත්වීම, තත්ත්ව අධ්‍යයනය සඳහන් කළ හැක.

- මිනිසුන් වෙත ලඟා වී, අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුතු ඔවුන්ගේ ජිවන තත්ත්ව පරිසර පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- ප්‍රතිපත්ති සහ සේවා දරන්නන් වෙතින් පවතින ප්‍රතිපත්ති සහ ඒවායේ විය යුතු වෙනස්කම් පිළිබඳ අදහස් දක්වන්න.
- වැඩමුළු, තත්ත්ව අධ්‍යයන, නාට්‍ය සහ වෙනත් ස්ථාන වල ලද අත්දැකීම් මගින් අදහස් හුවමාරු කර ගැනිම.

→ මෙගින් පවතින ප්‍රතිපත්ති වල ඇති ප්‍රධාන ගැටළු, ඒවායේ සිදුවිය යුතු වෙනස්කම්, සහ අළුතෙන් ඇති කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳ දැන ගත හැක.

ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී ඒකමතිකතාවය ගොඩනැගීම

ප්‍රතිපත්ති රෙකමදාරුවක සිට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් දක්වා යාම දීර්ඝ ක්‍රියාවලියකි. ඒකමතිකතාවය ගොඩනැගීමේ ක්‍රියාවලිය මගින් දේශපාලන පරිසරයක් තුළ, විවිධ අදහස් පවතින පුද්ගලයන් හට එක කරුණක් කෙරෙහි එකඟ විය හැක.

- වෙනස්කිරීමක් සඳහා ඒකමතිකතාවයක් ගොඩනැගීම

ජාතික, ප්‍රාදේශීය සහ පළාත් මට්ටමින් ප්‍රතිපත්ති සාදන්නන් සහ ක්‍රියාත්මක කරන්නන් පිරිසක් සංවිධානය කර ගන්න. මොවුන් එකිනෙකා පිළිබඳ දැන සිටිය යුතු අතර, සම්බන්ධීකාරක වරයෙක් හරහා වෙන වෙනම ක්‍රියා කළ යුතුය.

සම්බන්ධීකාරක වරයා විසින් පවතින තත්ත්වය සහ ප්‍රතිපත්ති වල විය යුතු වෙනස්කම් පිළිබඳ අදහස් හෙළි කරයි. ඉන්පසුව, සහභාගි වන සියළු දෙනාටම එම කරුණු ශ්‍රේණිගත කිරීමට පැවරේ. ඒකමතිකතාවය ගොඩනැගීමේ ක්‍රියාවලියට සහභාගිවන සියළු දෙනාම ඉන්පසුව, තමන්ගේ අදහස් දක්වමින් පැන නැගුනු ගැටළු ගැන සාකච්ඡා කළ යුතුය. සම්බන්ධීකාරක වරයා හරහා සියළු දෙනාම එකඟ වන පරිදි ඒකමතිකතාවයට එළඹීමට මෙහිදි හැකි වේ.

→ මෙමගින් සහාභාගි වන සියළු දෙනාටම අදහස් දැක්වීමට අවස්ථාව සැළසෙන අතර, කවරෙකුටවත් තමන්ගේ බලය පැතිරවීමට නොහැකි වේ..

මෙසේ සිදුවන සාකච්ඡා වට කිහිපයකින් ඒකමතිකතාවයකට එළඹිය හැකිය

→ මෙහිදි සම්බන්ධීකාරක වරයා විසින් මිනිසුන්ට නිදහස් හඬක් ලබා දෙන අතර, ප්‍රතිපත්ති සාදන්නන් සහ ක්‍රියාත්මක කරන්නන් නියම ආකාරයෙන් සාකච්ඡා සඳහා සහභාගි කරවා ගැනීම.

මෙමගින් වඩා පැහැදිලි වු සහ වැදගත් කම අනුව අංකනය කළ වෙනස්විය යුතු ප්‍රතිපත්ති මාලාවක් එළිදැක්වේ. එය තුළට මිනිසුන්ගේ සහ ප්‍රතිපත්ති සාදන්නන්ගේ එකඟ වූ අදහස් ඇතුළත් වේ.

අනෙත් වාර්තා සහ තොරතුරු සඳහා විස්තර ලබා ගැනීමට:

- **R8100 Investigating Improved Policy on Aquaculture Service Provision to Poor People** Twelve reports (ISBN 974-7313-63-4) http://www.streaminitiative.org/Library/India/india.html
- **R8334 Promoting the Pro-Poor Policy Lessons of R8100 with Key Policy Actors in India** Eight reports http://www.streaminitiative.org/Library/pdf/pdf-india/StakeholdersMeeting.pdf

මෙය පැමිණියේ කොහෙන්ද?
මෙම ප්‍රතිපත්ති සාරාංශගතය සාදනු ලැබුවේ NACA ආයතනය යටතේ ක්‍රියාත්මක වන STREAM ව්‍යාපෘතිය මගිනි.

ප්‍රතිපත්ති සාරාංශගතය 1 මගින් ගොවියන්, ධීවරයන්, ප්‍රාදේශිය දිස්ත්‍රික්ක සහ ජාතික ආයතන, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, DFID ආයතනය යටතේ ක්‍රියාත්මක වන NRSPP ව්‍යාපෘතිය සමග ඇති සම්බන්ධතාවය හෙළි කරයි. එමගින් 2002 මාර්තු මස සිට 2003 අප්‍රේල් මස දක්වා ව්‍යාපෘතිය මගින් සිදු කළ කටයුතු සාරාංශගත කරයි.

වැඩිපුර විස්තර සඳහා,

STREAM, NACA, Suraswadi Bldg, DOF Complex, Kasetsart University, Ladyao, Jatujak, Bangkok 10900 THAILAND, Fax (662) 561-1727, Tel (662) 561-1728